/

කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය 2018/2019

ENH: 3248 (දරිද්‍රතාවය සහ සමාජ අන්තර්ගෘහිතකරණය)

කාලය පැ දෙකකි (02)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

---

01.

I. නිරපේක්ෂ දරිද්‍රතාවය හා සාපේක්ෂ දරිද්‍රතාවය පැහැදිලි කිරීමට භාවිතා කළ හැකි මිනුම් දඬු ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

II. ඔබ ඉහත සඳහන් කළ මිනුම් දඬු අතරින් දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

III. නිසි දරිද්‍රතා දර්ශක භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතර ඇති දරිද්‍රතා වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 05)

02.

I. දරිද්‍රතාව යනු බහුමාන සංකල්පයකි. පැහැදිලි කරන්න. (ලකුණු 05)

II. රටක දරිද්‍රතාවය දිගින් දිගටම පැවතීමට බලපාන ප්‍රධාන සාධක පිළිබඳව විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 06)

III. "මතට තිත" වැඩසටහනට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කිරීමට උපකාරී විය හැක්කේ කෙසේද? (ලකුණු 04)

03.

I. ඔබ "දරිද්‍රතාවය හඳුනා ගැනීමේ සහභාගීත්ව ප්‍රවේශය" විස්තර කරන්නේ කෙසේද? (ලකුණු 05)

II. දරිද්‍රතාව තුරන් කිරීමේ ප්‍රධාන පියවරක් ලෙස දැනුවත් කිරීමේ වැඩසටහන්වල වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 05)

III. ශ්‍රී ලංකා රජය විසින් පවත්වන ලද දිළිඳුකම පිටුදැකීමේ ඕනෑම වැඩසටහනක් (anti-poverty program) විස්තර කරන්න. (ලකුණු 05)

04.

I. "සමාජ අන්තර්ගෘහිතකරණය (social integration) යනු ආර්ථිකයක් තුළ දරිද්‍රතාව අවම කිරීම සඳහා විසඳුමකි". සාකච්ඡා කරන්න. (ලකුණු 05)

II. "දරිද්‍රතාවයට ප්‍රධාන හේතුව සමාජ බහිෂ්කරණය යි". සමාජ බහිෂ්කරණයේ මූලික අංග භාවිතා කරමින් විස්තර කරන්න. (ලකුණු 05)

III. සමාජ අන්තර්ගෘහිතකරණ ක්‍රියාවලියේ (social inclusion) මූලික පියවරක් වශයෙන් කාන්තාවන්ට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති උත්සාහය විවේචනාත්මකව විමසා බලන්න. (ලකුණු 05)

05.

I. අන්තර්ගෘහිත සමාජයක් (inclusive society) ගොඩනැගීමේ ප්‍රධාන පියවර පැහැදිලි කරන්න. (ලකුණු 05)

II. ශ්‍රී ලාංකීය සමාජයේ ආන්තිකරණය වූ කණ්ඩායමක් ලෙස ග්‍රාමීය කාන්තා කණ්ඩායම් ඔබ හඳුනා ගන්නේ කෙසේද? විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 05)

III. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවය කෙරෙහි ක්ෂුද්‍ර මූල්‍යයේ බලපෑම විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 05)

06. ඔබ පහත ප්‍රකාශ සමඟ එකඟද? පැහැදිලි කරන්න.

I. "තොරතුරු සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම තුළින් සමාජයේ ඇති දිළිඳුකම තුරන් කළ හැක" (ලකුණු 05)

II. "සමාජ අන්තර්ගෘහිතකරණය (social integration) හා දරිද්‍රතාවදය අතර සෘණාත්මක සම්බන්ධතාවයක් පවතී" (ලකුණු 05)

III. "සමාජය විසින් පිළිගනු ලැබූ සියලූ දෙනා සමාජයට ප්‍රමාණවත් දායකත්වයක් ලබා දෙනු ඇත" (ලකුණු 05)

07. පහත සඳහන් ඒවායෙන් පහක් (05) කෙටියෙන් විස්තර කරන්න.

I. දරිද්‍රතාවය හඳුනා ගැනීමේ මූල්‍ය ප්‍රවේශය

II. දරිද්‍රතා පරතරය

III. අන්ත දුගීබව

IV. ගැමි දිරිය දරිද්‍රතා පිටුදැකීමේ වැඩසටහන

V. සමාජ ප්‍රාග්ධනය

VI. ළමා දරිද්‍රතාව

VII. ශ්‍රී ලංකාවේ නාගරික දරිද්‍රතාවය (ලකුණු 03 බැගින්)